# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2137/85 - 2019 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2019.08.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ අංක 31 දරන වගන්තිය සමග කියවිය යුතු අංක 41 දරන වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග සහ එහි සංශෝධන.

හරීන් ප්‍රනාන්දු,
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය.

2019 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් 2016.10.27 දින ප්‍රකාශයට පත්කරන ලද අංක 1990/23 දරන *අති විශේෂ ගැසට් පත්‍රය*, 2017.02.13 දිනැති අංක 2006/13 දරන *ගැසට් පත්‍රය*, 2017.05.05 දිනැති අංක 2017/41 දරන *ගැසට් පත්‍රය*, 2018.09.22 දිනැති අංක 2089/56 දරන *ගැසට් පත්‍රය*, 2018.10.18 දිනැති අංක 2093/39 දරන *ගැසට් පත්‍රය* හා 2019.01.10 දිනැති අංක 2105/38 දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියෝග පහත දැක්වෙන අයුරින් සංශෝධනය කරනු ලැබේ.

2016.10.27 දිනැති අංක 1990/23 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* ක්‍රීඩා නියෝගයන්ට අදාළ 5(4) නියෝගයේ (ග) උප වගන්තිය ඉවත් කොට ඊට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් :-

''(ග) ඔට්ටු ඇල්ලීමේ, සූදු ක්‍රීඩාවේ, පරදු තැබීමේ ව්‍යාපාරයක හෝ කිසියම් තරඟයකට සම්බන්ධතාවක් ඇති ඔට්ටු ඇල්ලීමේ හෝ සූදු ක්‍රීඩාවේ හෝ පරදු තැබීමේ ව්‍යාපාරයක හෝ එවැනි තරඟ සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයක හෝ ආයතනයන්හි එදිනෙදා කටයුතුවල නියැලී සිටින තැනැත්තෙක් හෝ ඔහුගේ පවුලේ ඕනෑම පූර්වාසන්න සාමාජිකයෙකු (කලත්‍රයා, මව, පියා, සහෝදරයෙක්, සහෝදරියක්, පුතා, දුව, බෑණා, ලේලිය) වන්නේ නම්,''

09 - 209


1A - PG 4623 — 517 (2019/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*